# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1585/26 - 2009 ජනවාරි 23 වැනි සිකුරාදා - 2009.01.23

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.බී.11/80.

### 1980 අංක 26 දරන ආහාර පනත

1980 අංක 26 දරන ආහාර පනතේ 32 වන වගන්තිය ප්‍රකාර, ආහාර උපදේශක කමිටුව විමසා, සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

නිමල් සිරිපාල ද සිල්වා,
සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍ය.

2008 සැප්තැම්බර් මස 16 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2006 නොවැම්බර් මස 23 වන දින අංක 1472/19 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද ආහාර (වර්ණ ගැන්වීමේ ද්‍රව්‍ය) නියෝග 2006, එහි 1 වැනි උපලේඛනයේ I වැනි සහ II වැනි වගු ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගු ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"*I වැනි වගුව*

ආහාර වර්ණ ගැන්වීමේ ද්‍රව්‍ය ලෙස යොදා ගත හැකි අනුමත කෘත්‍රිම වර්ණ ගැන්වීමේ ද්‍රව්‍ය

| *වර්ණ ගැන්වීමේ ද්‍රව්‍ය* | *පොදු නාමය* | *ජාත්‍යන්තර අංකන ක්‍රමය අනුව අංකය* |
|---|---|---|
| රතු | කාමොසින් (ඇසොරුබයින්)<br>පොන්සියු 4 ආර්<br>එරිත්‍රොසින් | 122<br>124<br>127 |
| කහ | සන් සෙට් යෙලෝ - එෆ්.සී.එෆ්<br>ටාට්‍රසින් | 110<br>102 |
| නිල් | ඉන්ඩිගොටින්<br>(ඉන්ඩිගෝ කාමයින්)<br>බ්‍රිලියන්ට් බ්ලූ - එෆ්.සී. එෆ්. | 132<br><br>133 |
| කොළ | ෆාස්ට් ග්‍රීන් - එෆ්.සී. එෆ්. | 143 |

ඉහත වගු අංක I හි නිශ්චිතව සඳහන් කර ඇති කෘත්‍රිම වර්ණ ගැන්වීමේ ද්‍රව්‍ය පහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලිය යුතු ය.:—

| | | |
|---|---|---|
| පිරිසිදු වර්ණක | අවම වශයෙන් | 85.0% |
| ජලයේ අද්‍රාව්‍ය ද්‍රව්‍ය | උපරිම වශයෙන් | 0.1% |
| අතිරේක වර්ණක | උපරිම වශයෙන් | 4.0% |
| ඊතර් මගින් නිස්සාරණය කර ගත හැකි ද්‍රව්‍ය | උපරිම වශයෙන් | 0.2% |
| අතරමැදි ද්‍රව්‍ය | උපරිම වශයෙන් | 0.5% |

*II වැනි වගුව*

**අනුමත කර ඇති වෙනත් වර්ණ ගැන්වීමේ ද්‍රව්‍ය**

| *ස්වාභාවික වර්ණ ගැන්වීමේ ද්‍රව්‍ය* | *ජාත්‍යන්තර අංකන ක්‍රමය අනුව අංකය* |
|---|---|
| කර්කියුමින් | 100 (i) |
| රයිබොප්ලෙවින් 5' පොස්පේට්, | 101 (i) |
| රයිබොප්ලෙවින් 5' පොස්පේට්, සෝඩියම් | 101 (ii) |
| කොචිනිල් ( කාමිනික් අම්ලය, කාමින්ස් ) | 120 |
| ක්ලෝරොෆිල්ස් | 140 |
| ක්ලෝරොෆිල්ස් කොපර් කම්ප්ලෙක්ස් | 141 (i) |
| කැරමල් I පංතිය | 150a |
| කැරමල් III පංතිය | 150c |
| කැරමල් IV පංතිය | 150d |
| කැරෝටින්ස් ස්වාභාවික සාරය (එළවළු) | 160a (ii) |
| ඇනාටෝ සාරය | 100d |
| පැප්‍රිකා ඔලේරෙසින් (කැප්සන්තින් හෝ කැප්සොරුබින්) | 160c |
| ලයිකොපීන් | 160d |
| කැරොටෙනල් ; බීටා ඇපෝ -8' | 160c |
| කැරටොනොයික් අම්ලය, බීටා - ඇපෝ-8' වල මීතයිල් හෝ එතිල් එස්ටර් | 160f |
| ප්ලේවොක්ස්ඇනීන් | 161a |
| කැන්තසැන්තීන් | 161g |
| බීට් රෙඩ් (බෙටනින්) | 162 |
| ඇන්තොසයනින් | 163(i) |
| ග්‍රේප් ස්කින් එක්ස්ට්‍රැක්ට් | 163(ii) |
| ටයිටේනියම් ඩයොක්සයිඩ් | 171 ” |

*අවලංගු කිරීම .* — 1993 ඔක්තෝබර් මස 14 වැනි දින අංක 788/7 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ වූ 1993 ආහාර - (ලේබල් කිරීම හා විවිධ ) නියෝගවල III වැනි කොටසෙහි පළ වූ අංක 29 සිට 32 වැනි රෙගුලාසි සහ එම නියෝගයේ 6 වැනි හා 7 වැනි උපලේඛන මෙයින් අවලංගු කරනු ලැබේ.

02-135

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.